# 5 ගම අමතකයි



මහගම සේකර නිර්මාණ ක්ෂේත්‍ර කිහිපයක නියැලුණු කලාකරුවෙකි. නවකතාව, කවිය, චිත්‍ර හා මූර්ති ශිල්පය චිත්‍රපට ආදි මාධ්‍ය අතුරින් ඔහුගේ ප්‍රවීණත්වය ප්‍රකට වූයේ පද්‍ය කාව්‍ය සම්බන්ධයෙනි. මෙහි දැක්වෙන 'ගම අමතකයි' නිර්මාණය මහගම සේකරගේ පද්‍ය නිර්මාණකරණයේ සන්ධිස්ථානයක් නියෝජනය කරයි.

සිදාදියට එන්නට මට
බුද්ධිය උඹ තමයි එදා
පාර කියා දුන්නේ
ගමෙන් උරුම වූ වස්තුව
පොදියක් බැඳ කර තියාන
උඹේ බහට රැවටීල යි සිදාදියට ආවේ

ඒ එනකොට ගෙන ආ දෙය
වියපැහැදම් කළා මිසක
මෙහි දී අලුතෙන් ඉපයූ කිසි ම දෙයක් නැත්තේ
ඉස බර කළ පුහු නම්බුව විතරයි මට ඇත්තේ

සිදාදියෙන් ආපසු මගෙ
ගමට යන්න ආසයි මට
ඒත් ගමට යන්නට දැන්
පාර මතක නැත්තේ

ඉතිරි ව ඇති සුළු වස්තුව
රැකගෙන ආපසු එන්නට
ඈත ඉඳන් අත වනලා
අම්මේ මට ගමට එන්න
පාර කියාපන්නේ

බෝමළුවේ සුදුවැල්ලේ
බෝධිය මුල දණගහලා
නිවන් ලබා හිත නිවන්න
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ

මැණික් ගඟෙන් දිය නාලා
ඇඟපත ගිනියම් දුරලා
කිලිකුණු සෝදා හරින්න
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ

වල් බිහි වී ගිය හේනේ
වල් පැළ උදුරා දමලා
පැළඉනි වැට තර කරලා
අලුතෙන් බිජුවට ඉහලා
රන් අස්වනු නෙළාගන්න
ඈත ඉඳන් අත වනලා
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ

මහගම සේකර



### 5.1 ක්‍රියාකාරකම 1

1. "ගම අමතකයි" කවි පන්තිය කුමන තේමාවක් පාදක කොටගෙන රචනා කරන ලද්දක් ද?
2. නාගරික ජීවිතය ගැන කතුවරයා සිය අප්‍රසාදය පළකොට ඇත්තේ කෙසේ ද?
3. ගම සිත නිවන තැනක් වන්නේ කෙසේ ද?
4. "ඇඟපත ගිනියම් දුරලා - කිලිකුණු සෝදා හරින්න" යන පද්‍ය පාඨයෙන් කියැවෙන අරුත් පැහැදිලි කරන්න.
5. බුද්ධිය අවඥාවෙන් බැහැර කරන කවියා, භාවමය ජීවිතය වැලඳගන්නා ආකාරය කවි පන්තිය ඇසුරෙන් පැහැදිලි කරන්න.
6. පන්තියේ දී මහගම සේකර විසින් රචනාකොට ඇති ගීත කීපයකට සවන් දෙන්න.
7. පන්තිය කණ්ඩායම් ලෙස බෙදී, මහගම සේකරගේ ගීත කීපයක් තෝරාගෙන, තාලානුකූල ව ගායනා කරන්න.

### 5.2 ක්‍රියාකාරකම 2

**භාෂා හුරුව**
**පහත දැක්වෙන පාඨයන්හි අරුත් දක්වන්න.**

| | | | |
|---|---|---|---|
| i. | පොදියක් බැඳ කර තියාන | v. | ඇඟපත ගිනියම් දුරලා |
| ii. | ඉස බර කළ පුහු නම්බුව | vi. | කිලිකුණු සෝදා හරින්න |
| iii. | සිදාදියට මං ආවේ | vii. | අලුතෙන් බිජුවට ඉහලා |
| iv. | නිවන් ලබා හිත නිවන්න | viii. | පැළඉනි වැට තර කරලා |

**වියරණ හුරුව**
**පහත දැක්වෙන කටවහරෙන් ලියා ඇති පූර්ව ක්‍රියා පද ලේඛන ව්‍යවහාරය අනුව ලියන්න.**

| | | | |
|---|---|---|---|
| i. | අත වනලා | - | අත වනා |
| ii. | දණගහලා | - | |
| iii. | දිය නාලා | - | |
| iv. | උදුරා දමලා | - | |
| v. | තර කරලා | - | |
| vi. | ඉහලා | - | |

### 5.3 පැවරුම

1. මහගම සේකර හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.
2. මේ කවි පෙළෙහි දැක්වෙන සිදුවීම් අතරින් එකක් තෝරාගෙන චිත්‍රයකට නගන්න.

## සංකල්පනා

සරුංගලේ වරල් සැලේ
නිසංසලේ ගුවන් තලේ
අපෙන් මිදී වෙන රටකට යන්න හදන්නේ
උපන් බිමට වැඩිය තැනක් කොහෙද තියෙන්නේ

සරුංගලේ බට පතුරින් නුඹ සැදුවේ අපේ ළමයි
සරුංගලේ ලාටු උලා රැලි කෙරුවේ අපේ ළමයි
සරුංගලේ කොළ අලවා හැඩ කෙරුවේ අපේ ළමයි
සරුංගලේ නුඹ අහසේ අපේ ළමයි තාම බිමයි

සරුංගලේ නුඹ වෙනුවෙන් ගුටි කෑවේ අපේ ළමයි
සරුංගලේ නූල් යොදා උඩ ඇරියේ අපේ ළමයි
සරුංගලේ උඩ ගිය දා මතක නැතේ අපේ ළමයි
සරුංගලේ නුඹ වාගෙයි රට හැර යන අපේ ළමයි

**ගී පද රචනය** **මහාචාර්ය සුනිල් ආරියරත්න**
**ගායනය** **නන්දා මාලිනී**